සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA2 විභාගය - 2017 ජනවාරි

## (AA21) උසස් මූල්‍ය ගිණුම්කරණය

(Advanced Financial Accounting)

2017-01-21
පෙරවරු
[8.45 – 12.00]

පිටු ගණන : 11
ප්‍රශ්න ගණන: 10

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්න වලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

අනිවාර්යය ප්‍රශ්න හත (07) කි.

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.3 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.1 **සීමාසහිත හාඩි (පෞද්ගලික) සමාගම,** විසින් 2014 අප්‍රේල් 01 දින රු.500,000/- ක පිරිවැයකට පිරියතයක් අත්පත් කරගන්නා ලදී. පිරියතෙහි අපේක්ෂිත ආයු කාලය අවුරුදු පහක් වන අතර සරල මාර්ග ක්‍රමයට වත්කම ක්ෂය කරනු ලබයි. ආයුකාලය අවසානයේ එහි සුන්බුන් වටිනාකම පිරිවැයෙන් 10% ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

2016 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අය කළ යුතු ක්ෂය ප්‍රමාණය වන්නේ:

(1) රු.150,000/- කි. (2) රු.180,000/- කි.

(3) රු.100,000/- කි. (4) රු.90,000/- කි.

(ලකුණු 02)

**1.2** ලාභ අරමුණු කර නොගත් සංවිධාන (Non-profit oriented organizations - NPOs) සම්බන්ධයෙන් පහත ප්‍රකාශන සැලකිල්ලට ගන්න:

**(a)** ලාභ අරමුණු කර නොගත් සංවිධානයක් කිසි විටෙක එහි මෙහෙයුම් වලින් අතිරික්තයක් උපයන්නේ නැත.

**(b)** ලාභ අරමුණු කර නොගත් සංවිධාන සාමාජික මුදල් වලින් පමණක් ආදායම් උපයයි.

**(c)** ක්‍රියාකාරකම්වල ශුද්ධ ප්‍රතිඵලය අතිරික්තය හෝ ඌනතාවය ලෙස හඳුන්වයි.

**(d)** ලාභ අරමුණු කර නොගත් සංවිධාන කොටස්හිමියන් විසින් පත්කරන ලද අධ්‍යක්ෂ මණ්ඩලයකින් පාලනය වේ.

ඉහත ප්‍රකාශන අතුරෙන්, නිවැරදි ප්‍රකාශනය / ප්‍රකාශන වන්නේ:

(1) **(c)** සහ **(d)** පමණි. (2) **(a), (b)** සහ **(c)** පමණි.

(3) **(c)** පමණි. (4) ඉහත සඳහන් සියල්ලම. (ලකුණු 02)

**1.3** පාලන ගිණුම් සම්බන්ධයෙන් පහත ප්‍රකාශන ඔබට දී ඇත:

**(a)** එක් එක් පුද්ගල ගිණුම් වෙනුවෙන් වෙන් වෙන්ව උප ලෙජර් ගිණුම් පවත්වා ගන්නා අතර එම ගිණුම් ශේෂයන්හි මුළු එකතුව පොදු ලෙජරයේ අදාල පාලන ගිණුමේ ශේෂය සමග එකඟ වෙයි.

**(b)** තොග වෙනුවෙන් පවා පාලන ගිණුමක් පවත්වාගෙන යා හැකිය.

**(c)** ණයගැති පාලන ගිණුම හා ණයහිමි පාලන ගිණුම අතර සටහන් තිබිය හැකිය.

ඉහත ප්‍රකාශන අතුරෙන්, පාලන ගිණුම් වලට අදාලව නිවැරදි ප්‍රකාශනය / ප්‍රකාශන වන්නේ:

(1) **(a)** පමණි. (2) **(b)** පමණි.

(3) **(a)** සහ **(c)** පමණි. (4) ඉහත සඳහන් සියල්ලම. (ලකුණු 02)

*අංක 1.4 සිට 1.7 දක්වා ප්‍රශ්න වලට උත්තර, ප්‍රශ්න අංකය සමග උත්තර පොතේ ලියන්න.*

**1.4** ස්කන්ධ කොටස් සමග සන්සන්දනය කරන විට, දිගුකාලීන මූල්‍යන මූලාශ්‍රයක් ලෙස ණයකර නිකුත් කිරීමෙන් සමාගමකට ලැබිය හැකි වාසි දෙකක්(02) සඳහන් කරන්න. (ලකුණු 02)

**1.5** දිගුකාලීන මූල්‍යන මූලාශ්‍රයක් ලෙස ස්කන්ධ කොටස්වල ඇති වාසි තුනක්(03) සඳහන් කරන්න. (ලකුණු 03)

**1.6** කොටසක් රු.25/- බැගින් අතිරේක සාමාන්‍ය කොටස් 250,000 ක් නිකුත් කිරීමට 2016 මාර්තු 20 දින **සීමාසහිත ABC සමාගම** විසින් තීරණය කරන ලදී. කොටස් 270,000 ක් සඳහා අයදුම්පත් ලැබී තිබුණි. පසුව කොටස් 250,000 ක් විභජනය කරන ලද අතර, වැඩිපුර ලැබුණු අයදුම්පත් සමග මුදල් ආපසු ගෙවන ලදී.

මෙම කොටස් නිකුතුව වාර්තා කිරීමට අවශ්‍ය ජර්නල් සටහන්, මුදල් සටහන් ද ඇතුළුව පිළියෙල කරන්න. (ලකුණු 03)

**1.7** 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වන වගන්තිය අනුව, පහත එක් එක් අයිතමය සඳහා අදාල ප්‍රතිපාදන සඳහන් කරන්න.

(1) නව හවුල්කරුවෙක් හඳුන්වා දීම.

(2) ප්‍රාග්ධනයට අමතර අත්තිකාරම් සඳහා පොලිය.

(3) හවුල් ව්‍යාපාරයේ පොත්පත්. (ලකුණු 06)

*A කොටසෙහි අවසානය*

## B කොටස

අනිවාර්යය ප්‍රශ්න පහ (05) කි.

(මුළු ලකුණු 25)

### 02 වන ප්‍රශ්නය

**සීමාසහිත අමායා (පෞද්ගලික) සමාගමේ** 2016 ජූලි 01 වන දිනට වෙළෙඳ ගෙවිය යුතු මුදල් (ණයහිමි) පාලන ගිණුමේ ශේෂය රු.305,400/- ක් විය.

2016 ජූලි මාසය සඳහා **සීමාසහිත අමායා (පෞද්ගලික) සමාගමේ** වෙළෙඳ ගෙවිය යුතු මුදල් සම්බන්ධයෙන් පහත සඳහන් ගනුදෙනු උපුටාගෙන ඇත:

| | මුදල<br>රු. |
|---|---|
| ණයට ගැනුම් | 135,900 |
| ආපසු යැවුම් | 16,000 |
| ණයහිමියන්ට කළ ගෙවීම් | 103,000 |
| ලද වට්ටම් | 1,200 |

2016 ජූලි 31 දිනට වෙළෙඳ ගෙවිය යුතු මුදල් පාලන ගිණුමේ ශේෂය, තනි පුද්ගල (individual) වෙළෙඳ ගෙවිය යුතු මුදල් ශේෂයන්හි එකතුව සමග එකඟ නොවිය. පසුව කළ පරීක්ෂණයෙන් වෙනස සඳහා පහත හේතු අනාවරණය විය.

(1) **සීමාසහිත X සමාගමෙන්** රු.20,000/- ක ණයට ගැනුම්, පාලන ගිණුමේ නිවැරදිව සටහන් කර තිබුණ ද, **සීමාසහිත X සමාගමේ** තනි පුද්ගල ගිණුමේ වාර්තා කර නොතිබුණි.

(2) සැපයුම්කරුවෙකු වන **පෙරේරා** ට කළ රු.8,500/- ක මුදල් ගෙවීම, නිවැරදිව පාලන ගිණුමේ සටහන් කළ නමුත් අදාල තනි පුද්ගල වෙළෙඳ ගෙවිය යුතු මුදල් ගිණුමෙන් එය මගහැරී ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) 2016 ජූලි මාසය සඳහා වෙළෙඳ ගෙවිය යුතු මුදල් (ණයහිමි) පාලන ගිණුම **පිළියෙල කරන්න**. (ලකුණු 03)

(b) 2016 ජූලි 31 දිනට වෙළෙඳ ගෙවිය යුතු මුදල් පාලන ගිණුමේ ශේෂය, එම දිනට තනි පුද්ගල ගෙවිය යුතු මුදල් ගිණුම්වල ශේෂයන්හි එකතුව සමග සැසඳීමේ ප්‍රකාශනයක් **පිළියෙල කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

### 03 වන ප්‍රශ්නය

**අශාන්, හෂාන් සහ රොෂාන්** ලාභ/අලාභ පිළිවෙලින් 4 : 3 : 3 අනුපාතයට බෙදාගනිමින් හවුල් ව්‍යාපාරයක් කරගෙන යයි.

හවුල් ගිවිසුමේ පහත සඳහන් දෑ ඇතුලත් වේ:

- ගැනිලි සඳහා වාර්ෂිකව 12% බැගින් පොලිය අයකරයි.
- ජංගම ගිණුම් ශේෂ මත පොලිය ගෙවීම හෝ අයකිරීම සිදු නොකරයි.
- රු.125,000/- ක වාර්ෂික වැටුපකට **හෂාන්** හිමිකම් ලබයි.

පහත සඳහන් තොරතුරු ද සපයා ඇත:

(1) 2016 මාර්තු 31 දිනට හවුල් ව්‍යාපාරයේ ශේෂ පිරික්සුමෙන් පහත ශේෂ උපුටාගෙන ඇත:

| | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|
| 2015 අප්‍රේල් 01 දිනට ජංගම ගිණුම්: | | |
| **අශාන්** | | 2,000 |
| **හෂාන්** | 800 | |
| හවුල්කරුවන්ගේ ගැනිලි: | | |
| **අශාන්** 2015 අප්‍රේල් 01 දින | 1,000 | |
| **රොෂාන්** 2015 ඔක්තෝම්බර් 01 දින | 500 | |

(2) 2016 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ විසර්ජනය කිරීමට පෙර ශුද්ධ ලාභය රු.3,500,000/- කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ලාභා'ලාභ විසර්ජන ගිණුම **පිළියෙල කරන්න**.
(ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

**සීමාසහිත චාමි කේක් සමාගමේ,** 2016 දෙසැම්බර් 31 දිනට බැංකු ප්‍රකාශනයේ රු.53,029/- ක බැංකු අයිරා ශේෂයක් පෙන්නුම් කළ අතර, සමාගමේ මුදල් පොතේ රු.15,274/- ක හර ශේෂයක් පෙන්නුම් කළේය.

වෙනස සඳහා පහත හේතු හඳුනා ගෙන ඇත:

(1) තැන්පත් කරන ලද පහත චෙක්පත්, 2016 දෙසැම්බර් 31 දින වන විට උපලබ්ධි වී නොතිබුණි:

| චෙක්පත් අංකය | තැන්පත් කළ දිනය | වටිනාකම (රු.) |
|---|---|---|
| 321154 | 2016.12.28 | 156,200 |
| 265471 | 2016.12.31 | 24,675 |

(2) සමාගම විසින් නිකුත් කළ පහත චෙක්පත්, 2016 දෙසැම්බර් 31 වන විට ගෙවීම සඳහා ඉදිරිපත් කර නොතිබුණි:

| චෙක්පත් අංකය | නිකුත් කළ දිනය | වටිනාකම (රු.) |
|---|---|---|
| 628734 | 2016.12.25 | 3,274 |
| 628742 | 2016.12.28 | 115,248 |

(3) නිකුත් කරන ලද චෙක්පත් අංක 628730 හි නිවැරදි වටිනාකම රු.67,945/- ක් වුව ද, පොත් තබන්නා විසින් එහි වටිනාකම රු.69,745/- ක් ලෙස මුදල් පොතේ වැරදි ලෙස ඇතුලත් කර ඇත.

(4) 2016 දෙසැම්බර් 31 දින බැංකුව විසින් අයකළ රු.2,500/- ක චෙක්පොත් ගාස්තු, මුදල් පොතේ සටහන් කර නොතිබුණි.

(5) 2016 දෙසැම්බර් 31 දින බැංකුව විසින් වැරදීමකින් රු.5,250/- ක් **සීමාසහිත චාමි කේක් සමාගමේ** බැංකු ගිණුමට බැර කර ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සීමාසහිත චාමි කේක් සමාගම** සඳහා පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2016 දෙසැම්බර් 31 දිනට ගලපන ලද මුදල් පොත. (ලකුණු 02)

(b) 2016 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය. (ලකුණු 03)
(මුළු ලකුණු 05)

## 05 වන ප්‍රශ්නය

**සීමාසහිත ඔරාන් (පෞද්ගලික) සමාගම** විසින් 2013 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී එහි ව්‍යාපාරික කටයුතු සඳහා පාවිච්චි කිරීමට ගොඩනැගිල්ලක් ඉදිකරන ලද අතර ඒ සඳහා පහත පිරිවැය දරා ඇත:

| | **රු. ('000)** |
|---|---:|
| භූමිය සැකසීමේ පිරිවැය | 870 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය හා ශ්‍රමය | 1,590 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය ගෙනඒමේ කුලී | 160 |
| වෘත්තීය ගාස්තු (වාස්තු විද්‍යා, ඉංජිනේරු සහ නීති) | 630 |
| 2014 වර්ෂය සඳහා මහනගර සභා වරිපනම් | 50 |

ගොඩනැගිල්ලේ ඉදිකිරීම් 2013 මාර්තු 31 දින වන විට නිමකරන ලද අතර 2013 අප්‍රේල් 01 දින සිට ගොඩනැගිල්ල භාවිත කළ හැකි විය. ගොඩනැගිල්ලට අවුරුදු 50 ක ඵලදායී ආයුකාලයක් ඇති බවට ඇස්තමේන්තු කර ඇති අතර, එය සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත දෑ **ගණනය කරන්න**:

(a) 2013 අප්‍රේල් 01 දිනට ඉහත ගොඩනැගිල්ල වෙනුවෙන් ප්‍රාග්ධනීත කළ යුතු වටිනාකම. (ලකුණු 03)

(b) 2016 මාර්තු 31 දිනට ගොඩනැගිල්ලේ ධාරණ අගය. (ලකුණු 02)
(මුළු ලකුණු 05)

## 06 වන ප්‍රශ්නය

පහත සඳහන් තොරතුරු **රූරල් ක්‍රිකට් ක්‍රීඩා සමාජයෙ** හි 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට අදාල වේ:

(1) ක්‍රීඩා සමාජයේ වත්කම් සහ වගකීම් පහත පරිදි විය: *(රු.'000)*

| | **2015 දෙසැම්බර් 31දිනට** | **2016 දෙසැම්බර් 31 දිනට** |
|---|---:|---:|
| ඉඩම | 15,000 | 15,000 |
| ක්‍රිකට් උපකරණ | 4,400 | 4,100 |
| අතැ'ති හා බැංකුවේ ඇති මුදල් | 5,500 | 6,480 |
| හිඟ සාමාජික දායක මුදල් | 475 | ? |
| ඊළඟ වර්ෂය සඳහා කලින් ලද සාමාජික දායක මුදල් | 200 | ? |

වර්ෂය තුළදී ස්ථාවර වත්කම් එකතු කිරීම් හෝ ඉවත් කිරීම් සිදුවී නැත.

(2) සාමාජික දායක මුදල්:

- සාමාජිකයෙකු සඳහා වාර්ෂික දායක මුදල රු.25,000/- කි.
- වාර්තා අනුව, 2016 දෙසැම්බර් 31 දිනට ක්‍රිකට් සමාජයේ සාමාජිකයන් ගණන 50 කි.
- 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළදී, සාමාජික දායක මුදල් වශයෙන් රු.1,550,000/- ක් සමාජයට ලැබී තිබුණි. 2017 වර්ෂය සඳහා ලැබුණු රු.150,000/- ක දායක මුදල් මෙහි ඇතුලත් විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) 2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත අරමුදල **ගණනය කරන්න**. (ලකුණු 02)

(b) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **රූරල් ක්‍රිකට් ක්‍රීඩා සමාජයේ** දායක මුදල් ගිණුම **පිළියෙල කරන්න**. (ලකුණු 03)
(මුළු ලකුණු 05)

*B කොටසෙහි අවසානය*

# <u>C කොටස</u>

අනිවාර්යය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

## 07 වන ප්‍රශ්නය

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **යුනයිටඩ් ෆුට්බෝල් ක්‍රීඩා සමාජයේ** ලැබීම් සහ ගෙවීම් ගිණුම පහතින් දැක්වේ:

**ලැබීම් සහ ගෙවීම් ගිණුම** *(රු.'000)*

| | | | |
|---|---|---|---|
| 2016 ජනවාරි 01 දිනට ඉ/ගෙ ශේෂය | 6,800 | 2016 වර්ෂය සඳහා කුලී | 1,000 |
| පරිත්‍යාග | 700 | දුරකතන බිල්පත් | 450 |
| සාමාජික දායක මුදල් | 7,700 | විදුලිය බිල්පත් | 1,400 |
| 2016 'ඩාන්ස් නයිට්' ටිකට් විකුණුම් | 2,100 | පුහුණුකරු ගාස්තු | 2,100 |
| | | 2016 'ඩාන්ස් නයිට්' පොදු වියදම් | 850 |
| | | 2016 'ඩාන්ස් නයිට්' ත්‍යාග | 300 |
| | | ක්‍රීඩා උපකරණ (2016 දෙසැම්බර් 31) | 3,400 |
| | | 2016 දෙසැම්බර් 31 දිනට ප/ගෙ ශේෂය | 7,800 |
| | **17,300** | | **17,300** |

පහත සඳහන් අතිරේක තොරතුරු දී තිබේ:

ක්‍රීඩා සමාජයේ වෙනත් වත්කම් සහ වගකීම් පහතින් දැක්වේ:

*(රු.'000)*

| | **2016 ජනවාරි 01 දිනට** | **2016 දෙසැම්බර් 31 දිනට** |
|---|---|---|
| ක්‍රීඩා උපකරණ | 11,000 | 12,500 |
| හිඟ දායක මුදල් | 600 | 400 |
| කලින් ලද දායක මුදල් | 200 | 300 |
| උපචිත විදුලිය | 200 | 400 |
| 2016 'ඩාන්ස් නයිට්' ලැබිය යුතු ටිකට් විකුණුම් | - | 200 |
| 2016 'ඩාන්ස් නයිට්' ගෙවිය යුතු පොදු වියදම් | - | 140 |

ලද පරිත්‍යාග, ලැබුනු වර්ෂයේ ආදායමක් ලෙස හඳුනාගත යුතුය. 2016 දෙසැම්බර් 31 දින මිලට ගත් ක්‍රීඩා උපකරණ හැර වෙනත් ස්ථාවර වත්කම් එකතු කිරීම් හෝ ඉවත් කිරීම් වර්ෂය තුළදී සිදුවී නැත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **යුනයිටඩ් ෆුට්බෝල් ක්‍රීඩා සමාජයේ** ආදායම් සහ වියදම් ගිණුම **පිළියෙල කරන්න.** (ලකුණු 10)

## 08 වන ප්‍රශ්නය

**රශ්මි** ට අයත් ආහාරපාන සැපයීමේ (catering service) ව්‍යාපාරයක් වන **රසයි ෆුඩ්ස්** හි පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටා ගන්නා ලදි:

(1) ව්‍යාපාරයේ වත්කම් සහ වගකීම් පහතින් දැක්වේ:

*(රු.'000)*

| | **2016 ජනවාරි 01 දිනට** | **2016 දෙසැම්බර් 31 දිනට** |
|---|---|---|
| ආහාරපාන සැපයීමේ උපකරණ (ධාරණ අගයට) | 10,000 | 14,000 |
| බෙදාහැරීමේ වෑන් රථය (ධාරණ අගයට) | 15,000 | 13,000 |
| තොගය | 3,000 | 4,000 |
| අතැ'ති මුදල් | 7,200 | 10,250 |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 6,000 | 8,000 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 5,000 | 6,000 |
| 8% ණය මුදල | - | 5,000 |

(2) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළදී කරන ලද ගෙවීම් පහතින් දැක්වේ:

| | **(රු.'000)** |
|---|---|
| ගැනුම් සඳහා ණයහිමියන්ට කළ ගෙවීම් | 26,000 |
| කම්කරු ගාස්තු | 6,150 |
| විදුලිය හා රක්ෂණය | 3,800 |

(3) සියලුම ගැනුම් සහ විකුණුම් ණය පදනම මත සිදු කෙරේ.

(4) විකුණුම් මිල තීරණය කිරීමේදී, **රසයි ෆුඩ්ස්** ව්‍යාපාරය පිරිවැය මත 50% ක දළ ලාභයක් තබා ගනියි.

(5) **රසයි ෆුඩ්ස්** ව්‍යාපාරය 2016 ජුලි 01 දින පිරිවැය රු.5,000,000/- ක් වූ ආහාරපාන සැකසීමේ උපකරණ මිලට ගත් අතර අවුරුදු 3 ක් අවසානයේදී සම්පූර්ණයෙන් ගෙවා නිම කළ යුතු ණය මුදලකින් එයට අරමුදල් සපයා ගන්නා ලදි. කෙසේවුවද, ණය මුදල් මත වාර්ෂික පොලිය 8% ක් වන අතර සෑම වර්ෂයක් අවසානයේදීම එය ගෙවිය යුතුය.

(6) **රශ්මි** වර්ෂය තුළදී ඇගේ පුද්ගලික පරිහරණය සඳහා රු.500,000/- ක් මුදලින් ලබාගෙන ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

තනි පුද්ගල ව්‍යාපාරයක් වන **රසයි ෆුඩ්ස්** සඳහා පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය. (ලකුණු 07)

(b) 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## 09 වන ප්‍රශ්නය

**රොෂාන්ත, නිශාන්ත** සහ **ලසන්ත, "රොනිල් උපදේශකයෝ"** නමින් ප්‍රචාරණ හා අලෙවි ප්‍රවර්ධන හවුල් ව්‍යාපාරයක නිරතව සිටී.

හවුල් ගිවිසුමෙහි පහත සඳහන් කරුණු ඇතුළත් වේ:

(1) **රොෂාන්ත, නිශාන්ත** සහ **ලසන්ත** පිළිවෙලින් 5 : 2 : 3 අනුපාතයට ලාභා'ලාභ බෙදා ගනියි.

(2) හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් මත වාර්ෂිකව 5% බැගින් වූ ප්‍රාග්ධන පොලියකට හවුල්කරුවන් හිමිකම් ලබයි.

(3) ව්‍යාපාරය කළමනාකරණය කිරීම වෙනුවෙන් **රොෂාන්ත,** මාසිකව රු.35,000/- බැගින් වූ වැටුපකට හිමිකම් ලබයි.

**රොනිල් උපදේශකයෝ** හි ගිණුම් පොත් වලින් 2016 මාර්තු 31 දිනට පහත ශේෂ පිරික්සුම උපුටාගෙන ඇත:

| | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|
| විසර්ජනයට පෙර ශුද්ධ ලාභය | | 25,400 |
| 2015 අප්‍රේල් 01 දිනට හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්: | | |
| **රොෂාන්ත** | | 10,500 |
| **නිශාන්ත** | | 6,000 |
| **ලසන්ත** | | 9,000 |
| 2015 අප්‍රේල් 01 දිනට හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්: | | |
| **රොෂාන්ත** | 50 | |
| **නිශාන්ත** | 160 | |
| **ලසන්ත** | 330 | |
| දේපළ, පිරියත හා උපකරණ - පිරිවැයට: | | |
| ඉඩම සහ ගොඩනැගිල්ල | 51,250 | |
| මෝටර් වාහනය | 2,500 | |
| 2016 මාර්තු 31 දිනට, සමුච්චිත ක්ෂය: | | |
| ගොඩනැගිල්ල | | 3,000 |
| මෝටර් වාහනය | | 1,250 |
| බැංකු ශේෂය | 242 | |
| තොගය | 656 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් / වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 3,610 | 4,288 |
| **නිශාන්ත ට දුන් ණය (01 වැනි සටහන)** | 700 | |
| උපචිත වියදම් | | 60 |
| **එකතුව** | **59,498** | **59,498** |

<u>01 වැනි සටහන</u>

**නිශාන්ත,** රු.700,000/- ක ණය මුදලක් 2015 සැප්තැම්බර් 30 දින, හවුල් ව්‍යාපාරයෙන් ලබා ගත්තේය. මෙම ණය මුදල මත 10% ක වාර්ෂික පොලියක් අයකිරීමට එකඟ විය. මෙම ණය මුදල මත පොලිය ගිණුම් පොත්වල වාර්තා කර නොතිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න:**

(a) 2016 මාර්තු 31 දිනට, තීරු ක්‍රමයට, හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්. (ලකුණු 05)

(b) 2016 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 05)

(මුළු ලකුණු 10)

*C කොටසෙහි අවසානය*

# <u>D කොටස</u>

අනිවාර්යය ප්‍රශ්නයකි.

(ලකුණු 25)

## 10 වන ප්‍රශ්නය

**සීමාසහිත වෙබ්පැබ් (පෞද්ගලික) සමාගමේ** 2016 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම පහතින් දැක්වේ:

*(රු.'000)*

| | හර | බැර |
|---|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 200,000) | | 2,000 |
| 2015 අප්‍රේල් 01 දිනට, රඳවාගත් ඉපැයීම් | 4,860 | |
| පොදු සංචිතය | | 500 |
| දේපළ, පිරියත හා උපකරණ, පිරිවැයට: | | |
| මෝටර් වාහන | 8,500 | |
| යන්ත්‍රෝපකරණ | 6,400 | |
| ලීබඩු සහ සවිකිරීම් | 3,000 | |
| 2015 අප්‍රේල් 01 දිනට, සමුච්චිත ක්ෂය: | | |
| මෝටර් වාහන | | 2,125 |
| යන්ත්‍රෝපකරණ | | 2,400 |
| ලීබඩු සහ සවිකිරීම් | | 1,800 |
| 2016 මාර්තු 31 දිනට තොගය | 2,460 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් / වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 3,910 | 1,873 |
| බැංකුවේ සහ අතැති මුදල් | 250 | |
| 12% ණයකර | | 5,000 |
| ගෙවූ ලාභාංශ | 250 | |
| විකුණුම් | | 38,520 |
| විකුණුම් පිරිවැය | 15,646 | |
| පරිපාලන වියදම් | 3,545 | |
| බෙදාහැරීමේ වියදම් | 2,066 | |
| මූල්‍ය වියදම් | 331 | |
| ගෙවූ ආදායම් බදු | 3,000 | |
| **එකතුව** | **54,218** | **54,218** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2015 සැප්තැම්බර් 30 දින, සමාගම විසින් එකක් රු.100/- ක් බැගින් වූ ණයකර 50,000 ක් නිකුත් කරන ලදී. වාර්ෂිකව 12% බැගින් අර්ධ වාර්ෂිකව පොලී ගෙවිය යුතුය. 2016 මාර්තු 31 දිනෙන් අවසන් වූ මාස හය සඳහා පොලී ගෙවීම සිදුකර ඇත්තේ 2016 අප්‍රේල් 01 දිනදීය.

(2) 2016 මාර්තු 20 දින රාත්‍රියේදී ගංවතුරක් හටගත් අතර, රු.750,000/- ක් පිරිවැය වූ තොගයක් සම්පූර්ණයෙන් හානියට පත් විය. රක්ෂණ සමාගම 2016 මාර්තු 31 දින රක්ෂණ වන්දිය නිශ්චය කළ අතර, තොගයේ පිරිවැයෙන් 80% ක් වන්දි වශයෙන් ගෙවීමට එකඟ විය. මෙම සිදුවීම වාර්තා කිරීමට ගිණුම් පොත්වල කිසිදු සටහනක් තබා නොතිබුණි.

(3) දේපළ, පිරියත හා උපකරණ සරල මාර්ග ක්‍රමය යටතේ ක්ෂය කළ යුතුය. වත්කම් වල ඵලදායී ආයුකාලය පහත පරිදි වේ:

| | | |
|---|---|---|
| මෝටර් වාහන | : | වර්ෂ 4 |
| යන්ත්‍රෝපකරණ | : | වර්ෂ 8 |
| ලීබඩු සහ සවිකිරීම් | : | වර්ෂ 5 |

(4) 2016 මාර්තු 31 දිනට පහත සඳහන් උපචිත සහ කලින් ගෙවූ වියදම් ගිණුම් ගත කළ යුතුව ඇත:

| | **උපචිත (රු.)** | **කලින් ගෙවූ (රු.)** |
|---|---|---|
| රක්ෂණ | - | 8,000 |
| විගණන ගාස්තු | 70,000 | - |

(5) ලැබිය යුතු අඩමාන ණය ශේෂයක් වෙනුවෙන් රු.350,000/- ක ප්‍රතිපාදනයක් කිරීමට තීරණය කරන ලදී.

(6) 2015/16 තක්සේරු වර්ෂයේ ආදායම් බදු බැඳියාව රු.3,200,000/- ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. පසුගිය තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු බැඳියාවක් නොතිබුණි. 2015/16 තක්සේරු වර්ෂය වෙනුවෙන්, ස්වතක්සේරු ආදායම් බදු ගෙවීම් ලෙස, රු.3,000,000/- ක් සමාගම ගෙවා ඇත.

(7) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සඳහා අනුමැතිය දෙන ලද්දේ 2016 මැයි 21 වන දින වේ.

**ඔබ විසින් කළ යුතු දෑ,**

**සීමාසහිත වෙබ්පැබ් (පෞද්ගලික) සමාගමේ,** කළමනාකරණයේ භාවිතය සඳහා පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය. (ලකුණු 12)

(b) 2016 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 13)

(මුළු ලකුණු 25)

*D කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| **01 මට්ටම**<br>**අවබෝධය**<br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| **02 මට්ටම**<br>**භාවිතය**<br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| **03 මට්ටම**<br>**විශ්ලේෂණය**<br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |